// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1815/13 - 2013 ජූනි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2013.06.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය: කැප්‍රාලේ/අත්3/1/75.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

අවශ්‍ය මහජන කාර්යය :

කරදියාන කසල අංගන පරිශ්‍රයේ අක්කර 12 ක භූමි භාගයක ඔරිසෝන් විදුලි ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 576 ඒතුම්බෝවිල උතුර ග්‍රාම නිලධාරී වසමේ තුම්බෝවිල සහ වේරහැර ගම්වල පිහිටි මූලික පිඹුරු අංක කො. 9338 හි සඳහන් කැබලි අංක 1 සහ 2 (විස්තර අමුණා ඇත).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් 2013 ජූලි මස 17 වැනි දින පූ.භා. 9.30 ට කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තව ද 2013 ජූලි මස 10 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එල්. ඒ. කළුකපුආරච්චි,<br>
කැස්බෑව ප්‍රාදේශීය ලේකම් හා<br>
අත්කර ගැනීමේ නිලධාරී,<br>
කැස්බෑව කොට්ඨාසය.

2013 ජූනි මස 18 වැනි දින,<br>
කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

1. කැබලි අංක 01

ඉඩමේ නම: කරදියාන කුඹුර හෙවත් කඩොල් කුඹුර; විස්තරය: වගුරු බිම අයිතිය: රජය, මුල් හිමිකම් කියන අය: ආර්. එම්. සේරසිංහ, අංක 94/5, කිරුළපන පාර, කොළඹ 05, කාමන් සමරකෝන් සහ තවත් අය, අංක 72, එල් එස් වත්ත, බටකැත්තර, මඩපාත; ප්‍රමාණය: හෙක් 1.0853

2. කැබලි අංක 02

ඉඩමේ නම: කරදියාන කුඹුර හෙවත් කඩොල් කුඹුර, විස්තරය: වගුරු බිම අයිතිය: රජය, මුල් හිමිකම් කියන අය: ආර්. එම්. සේරසිංහ, අංක 94/5, කිරුළපන පාර, කොළඹ 05, කාමන් සමරකෝන් සහ තවත් අය අංක 72, එල් එස් වත්ත, බටකැත්තර, මඩපාත; ප්‍රමාණය: හෙක් 0.1642

07-91

## සංශෝධනයයි

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

පැරණි අංකය :- 9/2/3/994.
නව අංකය :- BD/ST/LND/1/ACQUI/9.
ඉඩම් අමාත්‍යාංශ යොමු අංකය: ජේ. 71 එල්.175 (වීඊ).

ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය) 7 වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ 1974.01.25 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* අංක 1-720 හි මා විසින් පලකරන ලද දැන්වීම පහත පරිදි සංශෝධනය විය යුතු වේ.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 ජූලි මස 31 වැනි දින අ.භා 2.30 ට සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය. තව ද 2013 ජූලි මස 24 වැනි දිනට මත්තෙන් ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු වේ.

ආර්. එම්. එස්. ඩී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
සොරණාතොට.

2013 ජූනි මස 13 වැනි දින,
සොරණාතොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
රිදීපාන - බදුල්ල.

*උපලේඛනය*

| *පිඹුරු අංකය* | *කැ.අ.* | *ප්‍රමාණය* | *ඉඩමේ නම* | *ගමේ නම* |
|---|---|---|---|---|
| අ.ග.පි.88 | 66 | 7-3-03.8 | ලෙච්චම්වත්ත | උඩලඇලේගම |
| අ.ග.පි.88 | 69 | 0-0-12.7 | ලෙච්චම්වත්ත පිටපොලේපතන | උඩලඇලේගම |

07-92

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.